# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 2 දරන විත්තාභ්‍යාස සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථාන සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ **2007** ජනවාරි මස **22** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 ජනවාරි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ **:** රු. 8.25 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2007 අංක 2 දරන විත්තාභ්‍යාස සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථාන සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 ජනවාරි මස 22 වන දින]

එල්. ඩී.—ඕ. (අයි.එන්.සී) 26/2004.

## විත්තාභ්‍යාස සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථාන සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

විත්තාභ්‍යාස සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථාන සංවර්ධන සභාව යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සභාවේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කරගෙන ගොස් ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එසේ සංස්ථාගත කිරීම මහජන යහපතට හේතු වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 2 දරන විත්තාභ්‍යාස සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථාන සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ සිට හා ඉන් පසු (මෙහි මින් මතු "මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) විත්තාභ්‍යාස සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානයෙහි දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මෙහි මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "විත්තාභ්‍යාස සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර, ඒ නාමයෙන් ද, ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. විත්තාභ්‍යාස සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව පිහිටුවීමට හේතු වූ පොදු පරමාර්ථ පහත දැක්වෙන ඒවා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි චිත්තාභ්‍යාස සංවර්ධන හා පර්යේෂණ කටයුතු පතුරුවාලීම සහ සමථ, විදර්ශනා භාවනා ක්‍රම පිළිබඳව කැමැත්ත දක්වන අය පුහුණු කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි ආචාර ධර්ම පිළිබඳ පුහුණුවක් හා මානසික ශික්ෂණය, චිත්ත දියුණුව ආදිය පවත්වා ගෙන යාම සහ ඒවා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම ;

(ඇ) පොදු මහජනයා තුළ ඇතිවන මානසික ගැටළු, ප්‍රශ්න, අවුල් වියවුල් විසඳාලීම සඳහා අදාළ ධර්මානුකූල උපදේශනය ලබා දීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශයන්හි විශ්වවිද්‍යාල, විද්‍යා පීඨ, පිරිවෙන් සහ පාසල් ආදී විවිධ වූ අධ්‍යාපනික ආයතනවල සිටින චිත්තාභ්‍යාස සංවර්ධන හා පර්යේෂණ කටයුතුවලට ඇල්මක් දක්වන අය ඒ සඳහා යොමු කරවීම සහ ඒ පිළිබඳ පර්යේෂණ කටයුතු සඳහා අදාළ සියලුම අවශ්‍යතා හා පුස්තකාල පහසුකම් සලසා දීම ;

(ඉ) බාල, තරුණ, මහලු යන අයගේ පූර්ණ කායික සහ මානසික සංවර්ධනය සඳහා උපකාරී වීම සහ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති අඳ, ගොළු සහ බිහිරි ළමුන් සඳහා අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඊ) මත්පැන්, මත්කුඩු සහ විවිධ දුරාචාරයන් හා වෙනත් සමාජ විරෝධී කටයුතුවලට ඇබ්බැහි වූ ජනතාව එකී පුරුදුවලින් අත්මුදවා ගැනීමේ අරමුණින් ඔවුන් දැනුවත් කිරීම සහ ඔවුන්ගේ කුසලතා ඔප් නැංවීමට කටයුතු කිරීම සහ ඔවුන්හට සෞඛ්‍ය පුරුදු සම්බන්ධයෙන් උපදෙස් දීම ;

(උ) සේවා නියුක්ත දරුවන්ගේ රැකවරණය යටතේ සිටින වයස්ගත දෙමාපියන් රැක බලා ගැනීම සහ ඒ අය චිත්තාභ්‍යාස වැඩවලට සහභාගී කරවා ගැනීම ;

(ඌ) පාසල් අතහැර යන සිසු සිසුවියන් සඳහා යෝග්‍ය වන වෘත්තීයමය පුහුණු කටයුතු සංවිධානය කිරීම.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව— සංස්ථාවේ සාමාන්‍ය බලතල.

(අ) දායක මුදල්, ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමට සහ රැස් කිරීමට;

(ආ) සංස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට සහ අන්‍යාකාරයකින් ලබා ගැනීමට;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට හා වැසීමට සහ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට ;

(ඈ) කළමනාකරණ කමිටුව විසින් සුදුසු යයි තීරණය කරන ආකාරයකට, සංස්ථාවේ කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන කිසියම් අරමුදල් ආයෝජනය කිරීමට ;

(ඉ) යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට ;

(ඊ) සංස්ථාවේ සාමාජිකයකුව සිටි තැනැත්තකු නැවත ඇතුළත් කර ගැනීම සඳහා ගාස්තු අය කිරීමට ;

(උ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා දේශීය මෙන්ම ජාත්‍යන්තර රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවලින් ආධාර, උපකාර සහ සහයෝගිතාව ලබා ගැනීමට ; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වූ හෝ ආනුෂංගික හෝ අදාළ විය හැකි යම් සියලු ක්‍රියා, කාරණා සහ දේ කිරීමට, ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට,

සංස්ථාවට බලය ඇත්තේය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සාමාජිකයන්ගෙන් සමන්විත වූ (මෙහි මින් මතු "කළමනාකරණ කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ කමිටුවක් වෙත මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරූවා වූ සාමාජිකයන්, සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සාමාජික නාම ලේඛනය.

**6**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, මධ්‍යස්ථානයේ සාමාජිකයකු වූ සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කර ගනු ලබන සෑම තැනැත්තකුගේ ම නම ඇතුළත් නාම ලේඛනයක් පවත්වාගෙන යාමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

සංස්ථාවේ රීති.

**7**. (1) සංස්ථාව විසින්, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉවත් කිරීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම ;

(ආ) සංස්ථාවේ ධුර දරන්නන් පත්කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුර අත්හැරීම සහ ඔවුන්ගේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන් ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන් සහ සේවකයන්ගේ බලතල, කාර්යයන් සහ කර්තව්‍ය ;

(ඈ) කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීමේ වේලාව, ස්ථානය පිළිබඳ දැන්වීම සහ ඒ රැස්වීම්වල න්‍යාය පත්‍රය, ගණපූර්ණය සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම ;

(ඉ) කළමනාකරණ කමිටුවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**8**. යම් මිළ දී ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතුවන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙහි ලා බලය හා හැකියාව තිබිය යුතු අතර, ඒ සියළු දේපළ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය. තව ද ඒ දේපළ සංස්ථාවේ තත් කාලයේ පවත්නා රීතිවලට යටත්ව, විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9**. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාර ගන්නා ලද ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, සම්මාදම් මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන එක් බැංකුවක හෝ ඊට වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**10**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි මධ්‍යස්ථානයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපිත කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට මධ්‍යස්ථානයට ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ ගාස්තු මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

මධ්‍යස්ථානය විසින් සහ මධ්‍යස්ථානයට ගෙවිය යුතු ණය.

විගණනය සහ ගිණුම්.

11. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් සහ වියදම්, වත්කම්, බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්-

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

12. සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලු ණය සහ බැරකම් ගෙවා, සමථයට පත් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, යම් ආදායමක් හෝ ලාභ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදාදීම රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම සංගමය හෝ සංගම්, සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ විසුරුවා හැරීමට පෙරාතුව ම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

13. ලේකම්වරයා හෝ යථා පරිදි බලය දෙනු ලැබූ සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුවද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු කළ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

**14**. සංස්ථාවේ කිසිම සාමාජිකයෙක්, සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සම්බන්ධයෙන්, ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු ග්‍රාහක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් සාමාජික මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**15**. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය හෝ සංස්ථාගත මණ්ඩලයක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**16**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.